රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:(94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்:(94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: PA/CS/POLICY/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.06.16

අමාත්‍යාංශ ලේකම්වරුන් /
දිස්ත්‍රික් ලේකම්වරුන් / දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**රාජ්‍ය සේවයේ තනතුරුවල වැඩ බැලීම / රාජකාරී ඉටු කිරීමට පත්කිරීම හා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීම - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය පිළිබඳව දැනුවත් කිරීම**

රාජ්‍ය සේවයේ තනතුරුවල වැඩ බැලීම/ රාජකාරී ඉටු කිරීමට පත්කිරීම හා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය දන්වමින් එහි ලේකම් විසින් යොමු කර ඇති අංක:PSC/APP/HB/01/2022 හා 2022.05.25 දිනැති ලිපියේ පිටපතක් මේ සමග යා කර එවමි.

2. ඒ අනුව, රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති 2022.04.26 දිනැති අංක.03/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛයෙන් අවධාරණය කර ඇති පරිදි රාජ්‍ය මුදල් අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නැවත දැනුම්දෙන තුරු විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා අයදුම්පත් ඉදිරිපත් නොකරන ලෙසට ද තනතුරුවල වැඩ බැලීමේ/ රාජකාරී ඉටු කිරීමට පත්කිරීම් සිදු කිරීම වෙනුවට හැකි සෑම අවස්ථාවක දීම නිලධාරීන් රාජකාරී ආවරණය කිරීමට පත්කිරීමට ඇති හැකියාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලෙස ද දන්වා ඇත.

3. එබැවින් විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා අයදුම්පත් ඉදිරිපත් නොකරන මෙන් කාරුණිකව දන්වමි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව දන්වා ඇති පරිදි හැකි සෑම අවස්ථාවකදීම පුරප්පාඩුව ඇති තනතුරුවල රාජකාරී ආවරණය කිරීමට ඇති හැකියාව පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම ද මැනවි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:
1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව

Phones: 011-2136600, 011-2136650

Fax: 011-2136602

011-2876169, 011-2876181

E-mail: info@psc.gov.lk

Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்

OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල

இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை

No. 1200/9, Rajamalwatta Road, Battaramulla


මගේ අංකය / எனது இல. / My No.: PSC/APP/HB/01/2022

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2022 මැයි මස 24 වන දින

27 MAY 2022

4891

30 MAY 2022

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>රාජ්‍ය සේවයේ තනතුරුවල වැඩ බැලීම්/ රාජකාරි ඉටු කිරීමට පත්කිරීම හා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධරයින් නැවත සේවයේ යෙදවීම</u>

රාජ්‍ය සේවයේ වියදම් පාලනය කිරීම සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති 2022.04.26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ අවධාරණය කර ඇති පරිදි රාජ්‍ය මුදල් පිරිමැස්මෙන් පරිහරණය කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාව මින් ඉදිරියට රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරුවල වැඩ බැලීමේ/ රාජකාරි ඉටු කිරීමේ පත් කිරීම් සිදු කිරීම වෙනුවට හැකි සෑම අවස්ථාවකදීම නිලධාරීන් රාජකාරි ආවරණය කිරීම සඳහා පත් කිරීමට ඇති හැකියාව පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලෙස ද විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා අයදුම්පත් නැවත දැනුම් දෙන තුරු ඉදිරිපත් නොකරන ලෙස ද ඔබට දැනුම් දීමට නියෝග කර ඇත.

02. ඒ අනුව අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

එම්.ඒ.බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව